
# Project 61
# 61 වන ව්‍යාපෘතිය

DP EDUCATION

## Coding School






LIVEWORKSHEETS

❖ Color picker එකක් නිර්මාණය කරමු.








❖ ඉහත ආකාරයට screen එක design කරගැනීමට ප්‍රථමයෙන් screen එකෙහි ඉහළින් label එකක් add කරගන්න. එහි “Color Piker” ලෙස text එක සටහන් කරන්න. එහි properties මේ ආකාරයෙන් වෙනස් කරගන්න.

❖ ඉන්පසුව color pallet එක නිර්මාණය කරගමු. මේ සඳහා buttons භාවිතා කරන්න.







❖ එක් button එකක් පහත පරිදි properties වෙනස් කර නිර්මාණය කර එය duplicate කිරීමෙන් පහසුවෙන්ම color pallet එක සකස් කරගත හැකි වේ.

එක් එක් button එකෙහි id එක හා background color එක එකිනෙකට වෙනස් විය යුතුය.

❖ Select කරගන්නා color එක තිරයේ විශාල කොට පෙන්වීම සඳහා තව button එකක් add කරමු.





එම button එකෙහි properties පහත පරිදි වේ. Color එකක් select කරගන්නා තුරු එයට කිසිම වර්ණයක් නොමැති නිසා ඒ වන තෙක් button එකෙහි default background color එක transparent කරමු.

LIVEWORKSHEETS

- Color code ලෙස දැක්වීට label එකක් add කර එහි properties පහත ආකාරයෙන් වෙනස් කරන්න.




- එයට පහලින් select කරගන්නා color එකෙහි code එක පෙන්වීම සඳහා තවත් label එකක් add කර එහි properties පහත පරිදී වෙනස් කරගන්න. එම label එකෙහි background color එක transparent කර border width එක වැඩි කරන්න.




- එක් එක් වර්ණය සඳහා color code එක ලබාගත හැකි ස්ථානය පහත දක්වා ඇත.




ඔබ යම object එකක් සඳහා background color එක ලබා දීමේදී එම වර්ණයට අදාළ color code එක පහත දක්වා ඇති ස්ථානයේ පෙන්වයි. මෙම code එක ලබා දීම මගින්ද ඔබට අදාල වර්ණය background color එක ලෙස set කළ හැකි වේ. මෙහි දක්වා ඇත්තේ නිල් වර්ණය සඳහා color code එක වේ. එය #0000FF වේ.

- ඔබ color pallet එක නිර්මාණයේදී එක් එක් button එකට යොදාගත් background color හි color-codes app එක නිර්මාණය කිරීමේදී code කොටසේදී අවශ්‍ය වේ.

LIVEWORKSHEETS

- Color pallet එකෙහි එක් එක් වර්ණ කොටුවක් මතට mouse එක රැගෙන ගිය විට එම වර්ණය අපගේ අදාල වර්ණය විශාල කර පෙන්වීමට සාදාගත් button එක මගින් පෙන්වීමටත්, එම වර්ණයට අදාල color code එක පහළ කොටුව තුළ පෙන්වීමටත් අවශ්‍ය වන codes සකසාගමු.

- නිල් පැහැති වර්ණය අඩංගු කොටුව මතට mouse එක ගෙන ගිය විට මෙම codes මගින් ඉහත පැහැදිලි කළ ආකාරයට නිර්මාණය කරගත හැකිය.

```
onEvent("buttonBlue", "mouseover", function( ) {
  setProperty("object", "background-color", "#0000FF");
  setText("colorCode", "#0000FF");
});
```

මෙමගින් Mouse එක නිල් පැහැති button එක මතට පැමිණි විට id එක "object", background color එක transparent ලෙස අප නිර්මාණය කරගත් button එකෙහි background color එක නිල් වර්ණයේ color code එක වන "0000FF" මගින් නිල් පැහැයට වෙනස් කරයි. `setProperty("object", "background-color", "#0000FF");`

පහළ color code එක දර්ශණය කිරීමට නිර්මාණය කරන ලද label එකෙහි text එක `setText("colorCode", "#0000FF");` මගින් වෙනස් කරන්න.

- නිල් වර්ණය සහිත කොටුවෙන් පිටතට හෝ වෙනත් වර්ණයක් සහිත කොටුවකට mouse එක move කළ හොත් "object" button එකෙහි වර්ණය වෙනත් වර්ණයකට හෝ transparent කළ යුතු වේ.
Color code එක පෙන්වීමට ඇති label එකද එයට අනුරූපව වෙනස් විය යුතුය.

ඒ සඳහා පහත පරිදි code නිර්මාණය කරන්න.

```
onEvent("buttonBlue", "mouseout", function( ) {
  setProperty("object", "background-color", rgb(255,255,255,0));
  setText("colorCode", "");
});
```

මෙමගින් "object" button එකෙහි වර්ණය transparent කර color code දර්ශණය වන කොටුවේ text එක empty කරයි.

මෙසේ සිදුවන්නේ වර්ණ සහිත කොටුවකින් mouse එක out වූ විටය.

- ඉහත නිල් වර්ණය සහිත button එක සඳහා mouse එක පැමිණි විට හා ඉවත් වූ විට code නිර්මාණය කළ ආකාරයටම අනෙකුත් වර්ණ කොටු මතටද mouseover වීමේදී හා mouseout වීමට අදාළ codes නිර්මාණය කරන්න.
- ඔබ විසින් color pallet එක නිර්මාණයට භාවිතා කළ color codes මෙහිදී එක් එක් button එක සඳහා භාවිතා කරන්න.

LIVEWORKSHEETS

නිවැරදි පිළිතුර තෝරන්න.

1. Mouse hover කළ විට select කරන වර්ණය පහළින් පෙන්වීමට නිර්මාණය කළ App එක mouse click කළ විට වර්ණය පෙන්වීමට භාවිතා කළ යුතු නිවැරදි code කොටස තෝරන්න.

```
onEvent("buttonBlue", "mouseover", function( ) {
  setProperty("object", "background-color", "#0000FF");
  setText("colorCode", "#0000FF");
});
```

```
onEvent("buttonBlue", "click", function( ) {
  setProperty("object", "background-color", "#0000FF");
  setText("colorCode", "#0000FF");
});
```

```
onEvent("object", "click", function( ) {
  setProperty("object", "background-color", "#0000FF");
  setText("colorCode", "#0000FF");
});
```

2. Color code එක පෙන්වන text එකෙහි වර්ණය code මගින් රතු වර්ණයට වෙනස් කිරීමට නිවැරදි code කොටස කුමක්ද?

```
setProperty("colorCode", "text-color", "red");
```

```
setProperty("colorCode", "background-color", "red");
```

```
onEvent("colorCode", "click", function( ) {
  setProperty("colorCode", "background-color", "red");
});
```

LIVEWORKSHEETS

3.

```
onEvent("buttonBlue", "mouseout", function( ) {
  setProperty("object", "background-color", rgb(255,255,255,0));
  setText("colorCode", "");
});
```

මෙම code කොටස මගින් කුමක් සිදු කරයි ද?

Mouse එක අදාළ වර්ණ කොටුවට පැමිණි විට object නැමැති රවුමේ වර්ණය නිල් පැහැ කරයි.

Mouse එක නිල් පැහැති කොටුවෙන් ඉවත් වූ විට object නැමැති රවුමේ වර්ණය transparent කරයි.

Mouse එක නිල් පැහැති කොටුවෙන් ඉවත් වූ විට object නැමැති රවුමේ වර්ණය transparent කර colorCode නැමැති label එකෙහි text එක empty කරයි.

4. තැඹිලි වර්ණයේ color code එක කුමක් ද?

"#FF6D00"

"#000000"

"#00FF00"

5. Id එක "object" වන button එක රවුම් කිරීම සඳහා භාවිතා කරන property එක කුමක් ද?

border width (px)
0

border radius (px)
79

text alignment
center

LIVEWORKSHEETS